# CRG ගැන දැන ගැනීම (UNPACKING CRG)

## CRG යනු කුමක්ද? (WHAT IS CRG?)

ප්‍රජා, අයිතිවාසිකම්, හා ස්ත්‍රී-පුරුශ සමාජභාවය **(Communities, Rights and Gender) CRG** ලෙස හඳුන්වනු ලබන අතර, මෙවන් සංකල්පයක් හඳුන්වා දී ඇත්තේ, ඒ තුලින් විවිධ ප්‍රජාවන් ආශ්‍රිත ක්‍රමවේදයන් ශක්තිමත් කිරීමටත්, මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුශ සංක්‍රමණය පිලිබඳ දෘශ්ඨිකෝණයකින්ද **HIV**, ක්ෂය රෝගය, මැලේරියා හා ඒ හා අදාල අනෙකුත් ප්‍රතිචාර මර්ධනය කර සියළු ප්‍රජාවන් හට සමානාත්මතාවයක් උදා කර දීමත් උදෙසාය. **CRG** පාදක කරගත් මධ්‍යස්ථාන තම මැදිහත් වීම මේ වෙනුවෙන් කැප කරන්නේ අධි අවදානම් ප්‍රජාවන් අසමසම ලෙස මෙම රෝග වලට ගොදුරුවීමේ ප්‍රවණතාවක් පවතින බැවිනි.

2030 වන විට HIV, ක්ෂය රෝගය, හා මැලේරියා වසංගතය අවසන් කිරීමට, අධි අවදානම් කලාප, මානව හිමිකම් සහ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය, ගෝලීය හා ජාතික රෝග මර්ධන ක්‍රමෝපායන් තුල වඩාත් කැපී පෙනෙන කාර්‍යභාරයක් කිරීම අවශ්‍ය වේ. ගෝලීය අරමුදල තුල, විශේෂ CRG මූලික CRG දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කර ගැනීමෙන් මනා CRG මැදිහත්වීමක් විදහා පෙන්වීම සිදු කරනු ලබයි. එමගින් රෝගවලින් පීඩාවට පත් වූ ප්‍රජාවන් අර්ථවත් ලෙස ගෝලීය අරමුදල් ක්‍රියාදාමයන් සඳහා යෙදවිය හැකි බවට සහතික කර ඇති අතර ගෝලීය අරමුදල් ආධාරක වැඩසටහන් ඔවුන්ගේ අවශ්‍යතා වලට ප්‍රතිචාර දක්වයි. මෑතකදි දියත් කරන ලද "ගෝලීය අරමුදල් ක්‍රමෝපාය සැලැස්ම 2017-2022: වසංගත තුරන් කිරීමට ආයෝජනය" මගින් පෙර නොවූ විරූ අවධානයක් අධි අවදානම් කණ්ඩායම්, මානව හිමිකම්, හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය වෙත යොමුවී තිබේ.

අනෙකුත් සැලැස්මන්ගෙන් ස්වාධීනව, මෙම නව සැලැස්ම මගින්:

- රෝගී තත්ත්වයන් උපරිම, ගෙවීම් සිදු කිරීමට අවම හැකියාවක් ඇති හා අසමසම ලෙස රෝග වලින් පීඩාවට පත් රටවලට සම්පත් සැපයීම මගින් ආයෝජනයන්ගේ බලපෑම උපරිම කරයි;
- ප්‍රජා ප්‍රතිචාර හා ක්‍රමවේද ශක්තිමත් වී ප්‍රශස්ථ හා තිරසාර සෞඛ්‍ය ක්‍රමවේද ඇති කිරීමත්, කාන්තාවන්, දරුවන් හා යොවුන් පරපුර වෙත ඒකාබද්ධ සේවාවක් සැපයීමත් සිදු කරයි;
- මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව ආරක්ෂා කිරීම සහ රෝග මර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම වැඩිකිරීමට සහාය වේ;
- HIV, ක්ෂය රෝගය සහ මැලේරියාව පිලිබඳ ගෝලීය ක්‍රමෝපායන් ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා පෙර-ආයෝජනය කරනු ලබයි.

## CRG මැදිහත්වීම සඳහා විපරමක් (A CASE FOR CRG INTERVENTIONS)

CRG මැදිමත් වීම ප්‍රජා තුල HIV, ක්ෂය රෝගය හා මැලේරියා ව්‍යාප්තියත්, එමගින් පුද්ගලයින් අසමසම ලෙස රෝග වෙත ගොදුරු වීමත් විදහා පෙන්වන බැවින් ඒ සඳහා ප්‍රමුඛතාව ලබා දීම පහසු වී තිබේ. එමෙන්ම මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය ආරක්ෂා කිරීම රෝගී ප්‍රතිචාර වල ඵලදායීතාවයට බාධා කරන බාධක ජය ගැනීමට වැදගත් වේ. 2030 වන විට HIV, ක්ෂය රෝගය, හා මැලේරියා වසංගතය මුලිනුපුටා දැමීමේ අරමුණින් අධි අවදානම් කලාප, මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය යනාදී සංරචක වල වැදගත්කම ප්‍රජා සංවර්ධනය කෙරේ ඇඩිවම බලපා තිබේ. රටවල් තුල අධි අවදානම් ප්‍රජාවන් , මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය හා බැඳි ගැටළු මෙම ප්‍රධාන රෝග හමුවේ විවිධාකාර ලෙස හට ගෙන ඇත. මේ අතර කැපී පෙනෙනම ගැටළු වනුයේ සමාජීය අප්‍රසාදය, වෙනස් කොට සැලකීම, ප්‍රචණ්ඩත්වය මූලික කර ගනිමින් අධි අවදානම් ප්‍රජාවන් හට සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට බාධා පමුණුවීම, චර්යා පාදක කර ගනිමින් ගැරහීම, අධි අවදානම් කලාප සාපරාධීකරණයට ලක් කල නීති පැනවීම, මානව හිමිකම් භුක්ති විඳීමේ නිදහස උදුරා ගැනීම, සෞඛ්‍ය සේවාවන් වල ඇති අකර්මන්‍ය ස්වභාවය, දේශීය මට්ටමින් මෙම වැඩපිළිවෙලවල් වලදී රෝග අවධානමට ලක් ප්‍රජාවන්ගේ අවශ්‍යතා අදාල කොටස්කරුවන් විසින් නිවැරදිව සන්නිවේදනය නොවීම හෝ සන්නිවේදනය කිරීමට අපොහොසත් වීම වැනි දේය.

APCASO විසින් CRG අවශ්‍යතා ඇගයීමට ලක්කරන උපාංගයක් හඳුන්වා දී ඇති අතර එය අපගේ දේශීය කේන්ද්‍රගත ස්ථාන වල සහ CSO හවුල්කරුවන් අතර ක්‍රියාවට නංවා තිබේ. එමෙන්ම, UNAIDS සහයද ඇතිව කලාපයෙන් තෝරාගත් සංකල්ප සටහන් පිලිබඳ සමාලෝචනයක් සිදු කර තිබේ.

පහත දැක්වෙන්නේ එම සමාලෝචනයේදී හා අවශ්‍යතා ඇගයීම් වලදී හෙලිවූ CRG ගැටළු වේ:

- ස්වාධීන මානව හිමිකම් සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ වැඩසටහන් හා රෝග නිවාරණ හා ස්ත්‍රී-පුරුෂ සමානාත්වය යන සංරචක 2හිම සංකලිත වැඩසටහන් සඳහා ප්‍රමාණවත් තරම් අරමුදල් හා සහය නොමැති වීම;
- ප්‍රජා කණ්ඩායම් හා අධි අවදානම් ප්‍රජා  වලට අවශ්‍ය සේවා (ප්‍රජා-මූලික වෛද්‍ය පරීක්ෂණද ඇතුළුව) සැපයීමට, වැඩසටහන් පැවැත්වීමට හා අධීක්ෂණයට ඔවුන් නියෝජනය කරන සංවිධාන වලට අවශ්‍ය ඍජු අරමුදල් ප්‍රමාණවත් නොමැති වීම හෝ කිසිවක් නොමැති වීම;
- රෝගය නිවාරණය සම්බන්ධ ප්‍රජා-නොවන පාර්ශවකරුවන් අතර මානව හිමිකම්, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සහ ප්‍රජා සවිබල ගැන්වීම පිළිබඳ දැනුවත් කිරීමක් සිදු නොවීම;
- නීති සම්පාදකයින් හා නීති ක්‍රියාත්මක කරන්නන් ප්‍රමාණවත් පරිදි දැනුවත් නොකිරීම මගින් අධි අවදානම් කලාප වල පුද්ගලයින්ගේ ප්‍රජා අයිතිවාසිකම් වලට බලපෑම් එල්ල කරන දඬුවම් ඇතිවී තිබීම;
- මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය පිළිබඳව ක්‍රියාකාරී ප්‍රජා හා අධි අවදානම් කලාප තුළ වසංගත තත්වයන් ඔවුනට බලපාන ආකාරය පිලිබඳ ඇති නොදැනුවත්භාවය. මෙය ක්ෂය රෝගය හා මැලේරියාව තුළ වඩාත් කැපී පෙනේ;
- ක්‍රමෝපාය සංවර්ධන හා අරමුදල් අයදුම්පත් වල සිට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ ඇගයීම දක්වා, විවිධ මට්ටම් වල රටවලින් රෝග නිවාණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවන්, සිවිල් සංවිධාන හා අධි අවදානම් කලාප පුද්ගලයින්ගේ ප්‍රමාණවත් සහභාගීත්වයක් නොමැති වීම.

මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සඳහා ඇති බාධක HIV, ක්ෂය රෝගය, හා මැලේරියා නිවාරණය සම්බන්ධ කාර්‍යක්ෂමතාව හා ප්‍රමාණය හීන කරනු ලබයි. එම නිසා මෙම වසංගත තත්ව 3 මැඩලීම උදෙසා මේ පිලිබඳවද සඳහන් කිරීම අනිවාර්ය වේ. අධි අවදානම් කලාප ඉලක්ක කරගත් රෝග නිවාරණ වැඩසටහන් වල සාර්ථකත්වය සහතික කිරීම සඳහා තීරනාත්මක ආධාරකරුවන් ඉතා වැදගත් ය. එමෙන්ම රෝග නිවාරණ වැඩසටහන් හීදී CRG මැදිහත්වීම කෙරේද සමාන ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.